# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,873 — 1969 සැප්තැම්බර් 26 වැනි සිකුරාද — 1969.9.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 121 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... ... | |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම ... ... | — | | |



සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### ඌව පළාත

#### පිස්කල් විකිණීම

බදුල්ලේ ඉල්ලීම් උසාවියේදීය

එච්. ඇම්. ඔබේවර්ධණ බණ්ඩා, වතුපිටියේ ගෙදර, නුගහමුරේ, මැදගම්පත්තු කෝරලේ.......................................පැමිණිලිකාරයා.

අංක. එම්බී/4875.

එදිරිව

දහගෝනියේ අළුත්ගෙදර සයිමන්, තොටමුදුනේගෙදරවත්ත, දනගෝනිය ගම.............................................................විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ ඔක්තෝබර් මස 29 දින පෙරවරු 11 ට ඉඩම් පිහිටි ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් : රු. 950 ක් සහ මුළු මුදල ගෙවනතුරු 1965.10.30 දින සිට නීති පොළියද නඩු ගාස්තු රු. 237.40½ ක් හා සෑම රු. 5 කටම ශත 10 බැගින් වූ පවුන්ඩේජ් මුදලක්ද අයකර ගැණීම පිණිස :—

1. ඌව පලාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස කොට්ඨාශයේ මැදගම් පත්තු කෝරලේ දහගෝනියේ ගම පිහිටි ටී. පි. අංක. 303332 හි සඳහන්, උතුරට ටී. පී. 267601, නැගෙනහිරට පී. පී. 161 හි ලොට් 12 එච්, දකුණට සහ බස්නාහිරට පී. පී. 161 හි ලොට් 12 එක්ස් මායිම් දරණ, අක්කර දෙකයි පර්චස් විසිහයක් (අ.2 රූ.0 ප.26) විශාලත්වය ඇති '' තොටමුදුනේ ගෙදරවත්ත '' නැමති ඉඩමේ උතුරෙන් නොබෙදූ පහෙන් පංගුවක් (1/5) සහ එම නොබෙදූ පහෙන් පංගුව තුල පිහිටි ගොඩනැගිල්ල. තවද මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 1–49/161 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහතකී මැදගම්පත්තු කෝරලේ කෝන්ගොල්ල කන්දඹුවාවේගම පිහිටි, උතුරට රජයේ ඉඩම, නැගෙනහිරට මැදකුඹුරේ ඉමනියර, දකුණට අම්පිටිය, බස්නාහිරට හෙලබැද්දේබෝදඉර නොහොත් කුන්දිවැවේ කුඹුරේ ඉමනියර මායිම් දරණ වී අමුණු දෙකක විශාලත්වය ඇති '' අම්පිටියේ වෙලේබැද්දේබොඩ ඉරනම් කුඹුර '' නැමති කුඹුරෙන් නොබෙදූ පහෙන් පංගුවක් (1/5) සහ එහිතුල පිහිටි සැමදේ. තවද මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක. කේ. 1–143/162 යටතේ ලියාපදිංචි කර ඇත.

ඒ. ටි. සිවලිංගම්,
ඌව පලාතේ පිස්කල් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 6 වැනි දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේ දී ය.

9–959

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1969

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 69.6. 6 සිකුරාද | ... | 69. 5.30 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.6.13 සිකුරාද | ... | 69. 6. 6 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.6.20 සිකුරාද | ... | 69. 6.13 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.6.27 සිකුරාද | ... | 69. 6.20 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 සිකුරාද | ... | 69. 6.27 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 සිකුරාද | ... | 69. 7. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 සිකුරාද | ... | 69. 7.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 සිකුරාද | ... | 69. 7.18 සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 සිකුරාද | ... | 69. 7.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 සිකුරාද | ... | 69. 8. 1 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 සිකුරාද | ... | 69. 8. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 සිකුරාද | ... | 69. 8.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 සිකුරාද | ... | 69. 8.22 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 සිකුරාද | ... | 69. 8.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 සිකුරාද | ... | 69. 9. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 සිකුරාද | ... | 69. 9.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 සිකුරාද | ... | 69. 9.19 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 සිකුරාද | ... | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 සිකුරාද | ... | 69.10.17 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 සිකුරාද | ... | 69.10.24 සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 සිකුරාද | ... | 69.10.31 සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 සිකුරාද | ... | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 සිකුරාද | ... | 69.11.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 සිකුරාද | ... | 69.11.21 සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 සිකුරාද | ... | 69.11.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 සිකුරාද | ... | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 සිකුරාද | ... | 69.12.12 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 සිකුරාද | ... | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයකි